# ලක්දිව බෞද්ධ සම්ප්‍රදාය තුළ පත්තිනි දේව සංකල්පයේ පොදු භාවය හා එහි ඉදිරි ගමන

එම්. එම්. ආර්. උපාලි[1]

## හැඳින්වීම

ලාංකීය ඉතිහාසයේ ප්‍රගමනය කෙරෙහි අවධානය යොමු කළ උගත්හු ක්‍රි.පූ 3 වන සියවස ලංකා ඉතිහාසයේ සුවිශේෂී කාල පරිච්ඡේදයක් කොට සැලකූහ. එයට හේතු වූයේ සංවිධානාත්මක ආගමක් වශයෙන් මෙරටට හඳුන්වා දුන් බුදුදහමත් සමග ඇති වූ සංවිධානාත්මක සමාජ සන්දර්භය තුළ එතෙක් පැවති සමාජය කිසියම් වෙනසකට බඳුන් වීමයි. මෙරට වැසියන් බුදුසමය වැළඳ ගත්තේ මහින්දාගමනයෙන් පසුව යයි ද ඊට කලින් දිවයිනෙහි බෞද්ධයන් නොසිටි යයි ද පෙන්වීමට ගත් උත්සාහයක් දීපවංශයෙහි හා මහාවංශයෙහි ද සමන්තපාසාදිකාවේ ද දක්නා ලැබේ. එහෙත් මෙම ග්‍රන්ථවල අන්තර්ගතවන කරුණු වඩාත් සැලකිලිමත්ව විභාගකොට බැලුවහොත් ඊට වඩා වෙනස් නිගමනයකට එළඹීමට අපට සිදුවනු ඇත. එසේ වූව ද ප්‍රසිද්ධ වශයෙන් බුදුසමය මෙරටට ගෙන එන ලද්දේ දේවානම්පියතිස්ස රජු දවස බුදුදහමට අනුගත වූ සමස්ත සමාජයේම පිළිගැනීමට ලක්විය.

බුදුදහම වැළඳ ගැනීමෙන් පසුව ද සිංහල වැසියෝ පෙර සේම තමන්ගේ හිතවත් දෙවි දේවතාවුන් පිදුවෝ ය. එහෙත් බෞද්ධයන් බැවින් ඔවුහු අබෞද්ධ දෙවියකු ඇදහීමට අකමැති වූහ. එහෙයින් ඔවුහු සුමන දිව්‍ය රාජයාට කළාක් මෙන් ඔවුන් තත්ත්වයෙන් උසස් කළෝ ය. රටේ අනෙකුත් දෙවිවරු සියල්ලටම වූයේ මෙසේමයි. අබෞද්ධ සුළු දෙවිවරුන් ටික දෙනකු සමහර විට තවමත් සිටින්නට ඇත. එහෙත් මෙරටට පැමිණි පසු ද තවදුරටත් මේ තත්වය රැකගෙන සිටි ප්‍රධාන දෙවිවරු සියල්ලෝම බෞද්ධ බවට පත් වූහ.මේ අනුව සංකල්පය වශයෙන් ලංකාවේ දෙවියන් පිළිබඳ විශ්වාස බෞද්ධ සංකල්පයත් සමග අනුගත වෙමින් ඉදිරියට ඇදී ආ බව ප්‍රත්‍යක්ෂ වේ. මේ තත්ත්වය තුළ දේව සංකල්පයේ විකාශනයට පාදක වූ බෞද්ධ සමාජ පසුබිම කෙබඳු වූයේ ද යන්න අවධානය යොමුකිරීම වැදගත් වේ. මේ ආකාරයට නව සංකල්පයක් වශයෙන් බුදුදහම ලාංකේය සමාජයට අනුගත වන විට මෙරට පැවති සමාජයේ ද මලවුන් පිදීම, යකුන් ඇදහීම මෙන්ම දේව ඇදහීම ද පැවතිනි. මිහිඳු හිමියන් ලංකාවට වැඩම කොට මෙරටෙහි පැවති එම ආගමික සංකල්පයන් විනාශ කිරීමෙන් පතුරුවාලීමට වඩා, එම

[1] ඉතිහාස අධ්‍යනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය

සංකල්පයන්ට නව අර්ථකතනයක් ලබා දෙමින්, එම නව ආකල්පය වඩාත් සාර්ථක ලෙස සමාජයට බද්ධ කිරීමට මිහිඳු හිමි ගත් ප්‍රයත්නයත් ඒ අනුව සමාජයට හඳුන්වා දුන් නව ආගමික සංකල්පය, පැවති ආගමික සංකල්ප න්‍යායත්මක පදනම තුළ බුදු දහම මෙරටහි අභ්‍යන්තරීකරණය වීමෙහි තත්ත්වය මෙසේ වුවද ප්‍රායෝගික වශයෙන් එහි ස්වරූපය මීට වෙනස් ප්‍රවේශයක් ගනු ලැබූ බව දැකිය හැකිය. මේ තතත්වය තුළ දේව ඇදහීම් මෙන්ම අනෙකුත් මුල් සමාජයීය ඇදහීම් මහා සම්ප්‍රදායේ බාහිර අංගයන් බවට පත්වීමක් දක්නා ලැබිණි. එම පසුබිම ලාංකේය දේව සංකල්පය බෞද්ධ සංකල්පය සමගඅනුගත වෙමින් ඉදිරියට ඇදී ඒමට හේතු විය. මේ නිසා ලංකාවේ දේව ඇදහීම සමග බෞද්ධාගම එකවිට එක ළඟ පැවතුණි.

**පර්යේෂණ ගැටලුව**

ලක්දිව බෞද්ධ සම්ප්‍රදාය තුළ පත්තිනි දේව සංකල්පයේ පොදු භාවය හා එහි ඉදිරිගමන කෙබඳු මුහුණුවරක් ගනීද?

**ක්‍රමවේදය**

මූලාශ්‍ර අධ්‍යයනය හා ක්ෂේත්‍ර අධ්‍යයනයන් තුළින් තොරතුරු ලබා ගත් අතර මූලාශ්‍ර අධ්‍යයනය තුළින් ප්‍රාථමික දත්ත දක්ෂේත්‍ර අධ්‍යයනය තුළින් ද්විතීයික දත්ත හා තොරතුරු අත්පත්කර ගැණින.

**නිගමනය**

ලාංකේය සමාජයේ වර්ධනය වූ බෞද්ධ ආකල්පය තුළ බුදුන්ගේ ආනුගාමිකයන් වශයෙන් දෙවිවරු පිළිබඳ විශ්වාසය සමාජය තුළ ස්ථාපිත විය. මෙහි දී අධ්‍යයනයට බඳුන් කළ පත්තිනි දෙවිඳු ද මනා නිදසුනකි. සුමනකූටයට අරක්ගත් සමන් දෙවිඳුන් විමුක්ති මාර්ගයට පිළිපන් අයෙකු මෙන්ම බුදුන්ගේ ශ්‍රී පාද ලාංඡනය ආරක්ෂා කරන්නා වශයෙන් බුදුදහමට වඩාත් සමීප වීම වූවා සේම පත්තිනිය ද මතු බුද්ධත්වය අපේක්ෂා කරමින් මහණදම් පිරීම ඊට හේතුයි.මේ අනුව ලංකාවේ දේව සංකල්පයට බෞද්ධ පදනමක් ලබා දී තිබෙන බව පැහැදිලි වේ. මෙම පදනමත් සමග ලංකාවේ දේව සංකල්පයහි පැවැත්ම ද බෞද්ධ දෘෂ්ටිය ප්‍රමුඛ කොට ගෙන සිදු වූ බව පෙනේ. මෙම ප්‍රමුඛත්වය තුළ පත්තිනි දේවතාවියට හිමිවන වැදගත්කම පිළිබඳ විමසීමේ දී උධෘත කළ හැකි කරුණු කිහිපයක් වේ. බෞද්ධ ප්‍රතිපත්තියේ මූලික ලක්ෂණය ධර්මයෙන් ආරක්ෂාව ලැබේය යන්නයි. පත්තිනි දෙවියන් හා සම්බන්ධ කාර්යයන් තුළින් එම කරුණු මනා සේ පැහැදිලි

වේ. අධාර්මික හා වංක වූවන්ට පත්තිනි දෙවිඳුන් ගෙන් පිහිට ලැබීම දුෂ්කර කාර්යයකි. අතීතයේ පටන්ම පත්තිනි දේවාලය ආශ්‍රිත කර්‍යයන් ගොනු වී තිබෙනුයේ ද බෞද්ධ ප්‍රතිපත්තිවලට ප්‍රමුඛත්වය ලබා දෙමිනි. ශ්‍රී පාද වන්දනාවේ යන බැතිමතුන් පන්සිල් සමාදන්ව ඒ පින් සමන් දෙවිඳුන්ට මෙන්ම පත්තිනි දෙවියන්ට ද අනුමෝදන් කරනුයේ එහෙයිනි. මේ අනුව ප්‍රස්තුත දෙවිඳුන් පැහැදිලි ලෙසම බෞද්ධ දෘෂ්ටියෙහි පිහිටා පූජ්‍යත්වයට බඳුන් කරන දෙවියකු බව පෙනේ. මේ නිසා ලංකා ඉතිහාසය තුළ විමර්ශනයට බඳුන් කෙරෙන විදේශ දේව මණ්ඩලය අතර ප්‍රමුඛත්වයක් පත්තිනි දේවතාවියට හිමි වන බව දැක්විය හැකිය. මෙසේ ඇතිවූ පොදු භාවයට ප්‍රධාන වශයෙන්ම හේතු සාධක වී ඇත්තේ ඇය තුළින් මතුවන පතිව්‍රතාවේ බල මහිමය හා මතු බුදුවන්නට පෙරුම්පුරණ තැනැත්තියක් වීම යන ප්‍රධාන සාධක දෙක බව අධ්‍යයනයේදී මනා ලෙස අවබෝධ කරගත් කාරණයකි. ඒ ලාංකික සමාජය තුළ මහින්දාගමනයත් සමග බිහිවූ බෞද්ධ සම්ප්‍රදාය තුළ '' බුද්ධත්වය '' යන කාර්යය පිළිබඳව ජනතාව තුළ ඇති කරවූයේ ඉමහත් ගෞරවයකි. සිංහල බෞද්ධයාට බුද්ධත්වය යනු බෞද්ධාගමේ අවසාන උත්තරීතරත්වයයි. එම නිසා එවැන්නක් අපේක්ෂා කරමින් මහණදම් පුරණ පත්තිනි දේවිය වැනි දේවතාවියක් වන්දනයට ඔවුන් කිසිසේත් මැලිවන්නේ නැත. මේ නිසා වර්තමානයේ ලාංකික සමාජයේ සියලුම ප්‍රදේශයන් තුළ කුමන හෝ ආකාරයකින් පත්තිනි දෙවියන් වෙනුවෙන් භාර - හාර වීම්, වන්දනාමාන කිරීම් සිදු කරන්නේ මෙකී පොදු වූ තත්ත්වය නිසාය.මේ අනුව ලාංකික බෞද්ධ සම්ප්‍රධාය තුළ මෙම පත්තිනි දේව සංකල්පයේ දක්නට ඇත්තේ පොදු භාවයක් බව පැහැදිලි වේ. නමුත්, මෙකී පොදු භාවය ඉදිරියටත් සියවස් ගණනාවක් යන තෙක්ම ඉදිරියට ගමන් නොකරනු ඇතැයි අපේක්ෂා කරනු ලබයි.මන්දයත් ලංකා ඉතිහාසයෙහි දෙවිවරුන් පිළිබඳ පුවත් නිරීක්ෂණය කරන විට ප්‍රත්‍යක්ෂ වන එක් වැදගත් කරුණක් නම් ඒ ඒ දෙවියන්ගේ ජනප්‍රියතාව හැමදා එකසේ නොපැවති බවයි. කලෙක ජනප්‍රිය වූ කිසියම් දෙවි කෙනෙකු පසුව ජනප්‍රියත්වයෙන් ගිලිහෙන්නට ඉඩ තිබේ. එතරම් ජනප්‍රියව නොසිටි අන් දෙවි කෙනෙකු ගේ ජනප්‍රියභාවය පසුව ඉහළ යන්නට පුළුවන. මේ සම්බන්ධයෙන් ඉතා පැහැදිලි උදාහරණය වන්නේ 7 හා 8 වන සියවස්වල වර්ධනය වූ දෙවිනුවර උපුල්වන් දෙවියන්ගේ ජනප්‍රියභාවය 15 වන සියවස වන විට උච්චස්ථාවකට පැමිණ ඉන්පසු පිරිහී යාමත් 17 හා 18 වන සියවස්වල දී යලි පහතට වැටී තිබී විසිවන සියවසේදී ඉතා සීඝ්‍රයෙන් උච්චතම තත්ත්වයට පත් වීමත්ය.දෙවි කෙනෙකුගේ ජනප්‍රියභාවය වර්ධනය වීම අවසාන එම දෙවියන්ගෙන් අපේක්ෂා කරන කාර්යය සාධනය නිෂ්ප්‍රභා කරයි. දෙවි කෙනෙකුන්ගේ නැගීම හා වැටීම බාහිර හේතු නිසා සිදුවිය හැකිය. එසේම එය

බෞද්ධ දේව සංකල්පය තුළින් ජනිතවන තාර්කික ප්‍රතිඵලයක් ලෙසද ගැණිය හැකිය. දෙවි කෙනෙකුගෙන් ලෞකික අපේක්ෂා ඉටු කරවා ගැනීමේදී එම දෙවියන් ගේ බල පරාක්‍රමය භාවිතයට ගනු ලැබේ. සිය කාර්යය ඉෂ්ට වීමෙන් පසු බැතිමත්හු දෙවියන්ට පින් පමුණුවති. වඩ වඩාත් ජනප්‍රිය වීම නිසා වැඩිවශයෙන් බැතිමතුන් පිහිට පැතීමටත් එම පිහිට ලබාදීම නිසා දෙවියන්ට බොහෝ පින් ලැබීමත් සිදුවේ. මෙහි ප්‍රතිඵලයක් වන්නේ දෙවියන් බොහෝ සෙයින් පුණ්‍යවන්ත වී ලෝකෝත්තර පරමාර්ථ කෙරේ නැඹුරු වීමයි. අවසානයේ දෙවියෝ බෝධිසත්ත්වයකු බවට පත්වේ. එවිට ඇතැම් බැතිමතුන්ගේ අපේක්ෂා ඉෂ්ට කල නොහැකි තත්ත්වයකට දෙවියන් පත්වන්නට ඉඩ තිබේ. නාථ දේවාල වෙත යන්නන්ගේ සංඛ්‍යාව සීඝ්‍රයෙන් අඩු වී ඇත්තේ මේ හේතුව නිසාය. මන්දයත් නාථ දෙවියෝ මතු බුදුවන මෛත්‍රී බෝධිසත්ත්වයෝ වන බව ජනතාව විශ්වාස කරන නිසාය. විෂ්ණු, සමන් යන දෙවිවරු දැනටමත් සෝවාන් පෙළෙහි පිහිටියාවූ දෙවිවරුන්ය. පත්තිනි දේවිය ද මතු පිරිමි ජන්මයක් ලබා මතු බුදුවන බව සිංහල ජනයා විශ්වාස කරනු ලබයි. මේ නිසා වර්තමානයේ බෞද්ධ සම්ප්‍රදාය තුළද පත්තිනි දේව වන්දනයේ දක්නට ලැබෙන පොදු භාවය පසු කලෙක ක්‍රමයෙන් නැති වී යනු ඇතැයි උපකල්පනය කිරීම සාධාරණය. මන්ද ඇයද බෝධිසත්ත්වයෙකු වීමට පෙරුම් පුරන තැනැත්තියක් වීම නිසාය.

සිංහල බෞද්ධ දේව විශ්වාසයෙහි ගැබ්ව ඇති තාර්කික ක්‍රියාදාමය අනුව පත්තිනිය වඩ වඩාත් බෝසත් ගුණෙහි පේ වෙත්ම වත්මන දක්නට ඇති ලෞකික සබඳතා ක්‍රමයෙන් අඩු වනු ඇති බවත් අවසන ඇයගෙන් අපේක්ෂිත ලෞකික පරමාර්ථ සාධක සීමා වීම තුළ ජනයා ක්‍රමයෙන් ඇය තුළින් ඉවත් වීමක් දැකිය හැකිය. එමඟින් ඇයගේ ජනප්‍රියත්වය හීනවනු ඇති බව උපකල්පනය කළ හැකිය. දැනටමත් ඇතැම් ලෞකික කාර්යයන් ඉෂ්ට කරදීම අතින් සිය දක්ෂතා ප්‍රදර්ශනය කරන වෙනත් බලවේගයන් ජනප්‍රියත්වයෙන් වැඩි වන අයුරු පෙනේ. සමකාලීන දේව විශ්වාස ගැන අධ්‍යයනය කරන්නන් විසින් මෙහිදී අවධානයට යොමු කර ඇති විශේෂ දෙවිවරු දෙදෙනෙක් සිටී

එනම් :-

- සූනියම් දෙවියන්
- කාලි මෑණියන්

සූනියම් යක්‍ෂයා, කාලි යක්ෂණිය යනුවෙන් මුලදී හැදින්වුණු මොවුන් ක්‍රමයෙන් දේවතා තත්ත්වයටද පත්වී තිබේ. කඩවර, කුරුම්බර ආදීහුද මෙසේ ක්‍රමයෙන් ඉහළ නගිමින් සිටින්නෝය. ඔවුන්ද අනාගතයේදී දේව ගණයේ ප්‍රධාන

දෙවිවරු වනු ඇතැයි සැලකිය හැකිය. දෙවි දේවතාවුන්ගේ නැඟීම, බැසීම මෙන්ම දේව ගණයේ වෙනත් අභ්‍යන්තර විපර්යාසයන් ද ඔවුන් ජන සමාජයේ දක්නට ලැබෙන බලවේග හා සමග සම්බන්ධ වී පවතී. ඉහත සඳහන් කරන ලද හේතු කාරණා සාධාරණ වශයෙන් විභාග කිරීමේදී ලාංකික බෞද්ධ සම්ප්‍රදාය තුළ පත්තිනි දේව සංකල්පයේ වර්තමානයේ පවතින්නා වූ මෙම පොදු භාවය තව දුරටත් ඉදිරියට නොපවතිනු ඇතැයි නිගමනය කළ හැකිය.

ප්‍රමුඛ පදඃ බෞද්ධයන්, දෙවිවරු පත්තිනි, පොදුභාවය, පතිව්‍රතාව

ආශ්‍රිත ග්‍රන්ථ


අමරසේකර, දයා. (2007).*පත්තිනි දේවියෝ-යාතු කර්ම සහ පුද පූජා*.වරකාපොළඃ ආරිය ප්‍රකාශකයෝ.

අමරසේකර, ධර්මබන්ධු.(1967).*අපේ දෙවි දේවතාවෝ*,කොළඹ-10ඃ ඇම්.ඩී.ගුණසේන සහ සමාගම,

අස්සජි හිමි, තල්පෙ.(1998).*ජන කවිය දෙවියෝ සහ යක්ෂයෝ.* කොළඹ 10ඃ ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

කාරියවසම්, තිස්ස.(1991).*සිරිලක දෙවිවරු*.කොළඹ 10ඃ ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

කාරියවසම්, තිස්ස.(1992).*දෙවොල් දෙවියෝ*,කොළඹඃ සාර ප්‍රකාශන.

*සිංහල දේව පුරාණය.* (1994). (සංස්).ධර්මදාස. කේ.එන්.ඕ., සහ තුංදෙණිය, එච්.එම්., රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව.